දරුවන් රැක බලා ගැනීම, ගෙදර දොර පාලනය, ගෙවතු වගාව වැනි කටයුතුවලදී ගැමි මහිලාවන්ට මග පෙන්වන සංවිධානයක් හැටියට මහිලා සමිතියෙන් මාහැඟි සේවයක් සලසා ගත හැකිය.

# මහිලා සමිතිය

ලංකා මහිලා සමිතිය අඩ සියවසක කාල යක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් දිවයිනේ කාන්තා පරපුර වෙනුවෙන් මාහැඟි සේවාවක් ඉටු කරන සංවිධානයකි. මේ වන විට, මහිලා සමිතියේ ශාඛා සංඛ්‍යාව 2, 300 දක්වා ද, සාමාජික සංඛ්‍යාව 2, 00, 000 ක් දක්වා ද, ඉහළ ගොස් ඇතැයි වාර්තා වේ. සංස්ථාපිත ආයතනයන් වන මහිලා සමිතිය ප්‍රජා සංවර්ධන කටයුතු නිසා ජාත්‍යන් තර වශයෙන් ද පිළිගනු ලැබූවකි.

ලංකා මහිලා සමිතියේ අරමුණ මෙරට කාන්තා පරපුරේ අධ්‍යාපනික, සමාජයීය, හා ආර්ථික වර්ධනයයි. ගෘහ කර්මාන්ත, සමූපකාර ව්‍යාපාර, සමාජ සෞඛ්‍යය. රෝහල් හා සුභ සාධක මධ්‍යස්ථාන ආදී ක්ෂේත්‍ර මෙම ආයතනයේ සේවාවනට ඇතුළත් ය.

මහිලා සමිති ශාඛා මගින් ගම් මට්ටමේ සංවර්ධන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කෙරෙන අතර, ඒවා මෙහෙය වනු ලබන්නේ වැටුප් ලබන පුහුණු සේවිකාවන් හා පුහුණු ස්වේච්ඡාසේවිකාවන් ද විසිනි.

ගම් මට්මේ සමිතිවල නානා විධ කටයුතු සඳහා ග්‍රාම සංවර්ධන, සෞඛ්‍ය, කෘෂිකර්ම, කුඩා කර්මාන්ත අධ්‍යාපන, අලෙවි, සමූපකාර ආදී දෙපාර්තමේන්තුවල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල නිල ධාරීන් ගේ සහයෝගය ද ලබාගනු ලැබේ. ඔවුන් ගේ උපදෙස් හා මහ පෙන්වීම ද අනුව ගැමි මහි ලාවෝ ස්වකීය අභිවෘද්ධියට හේතු සාධක වන බොහෝ වැඩ කටයුතු සංවිධානය කර ගනිති. ගෙවත්තට අවශ්‍ය පෝර සඳහා කොම්පෝස්ට්

(26 පිටුවට)



සමිතියක මහිලාවන් පිරිසක් පැල සිටුවති.

(24 පිටුවෙන්)

පෝර වළවල් තැනීම, පානය සඳහා පිරිසිදු ජලය සපයා ගැනීම, පොදු ළිං වැඩි දියුණු කිරීම, වැඩි හිටි අධ්‍යාපනය, මැහුම් හා අත්කම් පන්ති පැවැත් වීම, ඉවුම් පිහුම් ක්‍රම උගෙනීම, ගෙවතු වගාව, පළතුරු ඇසිරීම ආදිය එවැනි වැඩ කටයුතු අතු රෙන් ප්‍රධාන ඒවාය.

**ගැමි මහිලාවන්ට අත හිත**

ගැමි මහිලාවන් දහ දෙනෙකුට හෝ ඊට වැඩි පිරිසකට එකතු වී මහිලා සමිති ව්‍යාපාරය යටතේ සමිතියක් පිහිටුවා ගත හැකි ය. මෙම කණ්ඩායමේ අවිවාහක තරුණ කාන්තාවන් තෝරාගෙන ස්වේච්ඡා සේවිකාවන් වශයෙන් විශේෂ පුහුණුවක් ලබාදීම මධ්‍යම සංවිධානයෙන් කෙරෙන කටයුත්තකි.

මහිලා සමිති මධ්‍යම සංවිධානයට අයත් මහිලා අභ්‍යාස ආයතනය මගින් අවුරුදු පතා මහි ලාවන් සඳහා අභ්‍යාස පාඨමාලා පවත් වනු ලැබේ. මෙම පාඨමාලාවන් සෞඛ්‍ය, කෘෂිකර්මය, ඉතිරි කිරීම, සමුපකාරය, පවුල් සැලසුම් ආදී විෂයයන් සම්බන්ධයෙනි.

ලංකා මහිලා සමිතිය මගින් දිවයින පුරා ආදර්ශ මධ්‍යස්ථාන 25 ක් පමණ පවත්ව ගෙන යන අතර, කෘෂිකර්මය, මැහුම් වැඩ, ආහාර සංරක්ෂණය, දරුවන් රැක බලා ගැනීම, ආදී කටයුතු එම මධ්‍යස්ථාන මගින් සංවිධානය කරනු ලැබේ. මව් සමිතිය මගින් දිවයිනපුරා දරුවන් රැක බලා ගැනීමේ මධ්‍යස්ථාන 50 ක් පමණ ද, පවත්වා ගෙන යන අතර, ඒවා සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආධාර ද සැපයේ.

ලංකා මහිලා සමිති ව්‍යාපාරය ඇරඹුණේ ගැමි ජන ජීවිතය මෙන්ම ගැමි අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය ද පහත් මට්ටමක පැවැති යටත් විජිත පාලන යුගයේදීය. විවිධ ග්‍රාමීය ආයතන අළුතින් බිහි වීමත්, රජයේ සුභ සාධන කටයුතු පුළුල් වීමත් සමඟ ම මෙම ව්‍යාපාරයේ කටයුතු පිළිබඳ පොදු අවධානය තරමක් දුරස් වූ නමුදු ගැමි පරපුර වෙනුවෙන් ඉදිරියටත් විශාල මෙහෙ යක් මෙම සංවිධානය මගින් ඉටු කළ හැකි බව පැහැදිලිව පෙනෙන්නට ඇත.